TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of Integrity

Media Release 2009/Sin/11

## මාධ්‍ය නිවේදනය

2009.08.20

### දේශපාලන පක්ෂවල ගිණුම් ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීමේ නව වගන්ති ගැන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ප්‍රසාදය පළකරයි.

යෝජිත පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතේ දේශපාලන පක්ෂවල වගවීම සම්බන්ධයෙන් පනවා ඇති වගන්ති පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා (TISL) ආයතනය දැඩි ප්‍රසාදය පළ කර සිටී.

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කෙරෙන මෙම වගන්ති අනුව දේශපාලන පක්ෂවලට අරමුදල් හා පරිත්‍යාග ලැබෙන මූලාශ්‍ර සහ ලැබුණ මුදල් ප්‍රමාණයන් පිළිබඳව වාර්ෂික ගිණුම් ප්‍රකාශවල ඇතුලත් කළ යුතුය. එසේම වාර්ෂික ගිණුම් ප්‍රකාශ මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කළ යුතුය. මෙම නව වගන්ති ක්‍රියාවට නැංවීම මගින් ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල හා මැතිවරණ ක්‍රමයේ විශාල වෙනසක් සිදුවනු ඇතැයි TISL විශ්වාසය පළකරයි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා හි විධායක අධ්‍යක්ෂ ජේ.සී. වැලිඅමුණ මහතා ප්‍රකාශ කරන්නේ " දේශපාලන පක්ෂවල ගණුදෙණුවල විනිවිදභාවය සුරක්ෂිත කිරීම සඳහා මහජනතාවට එම ගිණුම් ප්‍රකාශ පරීක්ෂා කර බැලීමට ඉඩ සලසා තිබීම ඉතා ප්‍රගතිශීලී පියවරක් බවයි. එයින් යහපාලනය සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය වන බවද වැලිඅමුණ මහතාගේ අදහසයි.

නිසි ආකාරයෙන් ගිණුම් ඉදිරිපත් නොකරන දේශපාලන පක්ෂවල සාමාජිකත්වය අහෝසිවන වගන්ති පිළිබඳවද ප්‍රසාදය පළකරන TISL ආයතනය, එවැනි වගන්තියක් වත්කම් ප්‍රකාශ නොකරන ජාතික මට්ටමේ මෙන්ම ප්‍රාදේශීය මට්ටමේ මහජන නියෝජිතයින් සම්බන්ධයෙන්ද ඇතුලත් කළ යුතු යැයි යෝජනා කරයි.